කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சு
Ministry of Labour and Foreign Employment

හයවන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 05, ශ්‍රී ලංකාව.
6 ஆவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 05, இலங்கை.
6th Floor, " Mehewara Piyesa", Narahenpita, Colombo 05, Sri Lanka.



| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. : MFE/DEV/HOB/03/vol ii | ඔබේ අංකය / உமது இல / Your No. : | දිනය / திகதி / Date : 2022.08. 31 |

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ චක්‍රලේඛ අංක : 02/2022

**එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන්හට පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීමට බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමය**

1 එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන් විසින් තම විදේශ විනිමය ඉපැයීම් මෙරටට ප්‍රේෂණය කිරීම මගින් ජාතික ආර්ථිකයට ලබා දෙන දායකත්වය ඇගයීම සඳහා විවිධ දිරිගැන්වීමේ යෝජනා ක්‍රම හඳුන්වා දීම පිණිස ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට හා ඊට අනුශාංගික අමාත්‍ය මණ්ඩල සටහනට 2022 අගෝස්තු 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී ඇත.

2 එහි ඇතුලත් එක් යෝජනා ක්‍රමයක් ලෙස පහත දක්වා ඇති විධිවිධාන යටතේ මෙරට බැංකු පද්ධතිය හරහා විදේශ විනිමය මෙරටට ප්‍රේෂණය කරන එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින්හට පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීමට හැකිවනු පිණිස මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

3 මෙම චක්‍රලේඛයට අනුව වාහන ආනයන බලපත්‍රය නිකුත් කිරීමේ බලය විදේශ රැකියා විෂය පථය අයත්වන අමාත්‍යාංශයට පැවරේ.

**4 කොන්දේසි**

4.1 මෙම ප්‍රතිලාභය සඳහා සුදුසුකම් ලැබීමට එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයා විසින් මෙරට බැංකු පද්ධතිය හරහා ප්‍රේෂණය කර ඇති විදේශ මුදල් ප්‍රමාණයෙන් අවම වශයෙන් 50%ක් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කර තිබිය යුතුය.

4.2 චක්‍රලේඛයෙහි ප්‍රතිපාදන මෙහි 4.4 වගුවෙහි දැක්වෙන කාලසීමාවට පමණක් බලාත්මක වන අතර වාහනයක් ආනයනය කිරීමට අදාල රජයේ බදු ඇතුළු සියලු වියදම් පියවීම සඳහා විධිමත් ලෙස බැංකු පද්ධතිය හරහා ප්‍රේෂණය කරන ලද විදේශ විනිමය භාවිතා කළ යුතුය.

ලේකම්/செயலாளர்/Secretary : +94 112 368164 කාර්යාලය/அலுவலகம்/Office : +94 112 581991 ෆැක්ස්/தொலைநகல்/Fax : +94 112 582938/+94 112 368165
විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : slmol@slt.lk / slmol @labourmin.gov.lk වෙබ් අඩවිය/இணையத் தளம்/Web site: www.labourmin.gov.lk

4.3 මෙම යෝජනා ක්‍රමය 4.4 වගුවෙහි දැක්වෙන කාලසීමාව ඉක්මවා ක්‍රියාත්මක වන අවස්ථාවකදී එතෙර රැකියාවක නිරත ශ්‍රී ලාංකිකයකුට එක් බලපත්‍රයක් නිකුත් කල දින සිට සෑම වසර 5කට වරක් වාහනයක් ආනයනය කිරීමට හිමිකම් ලැබෙන අතර, ලියාපදිංචියෙන් වසර 2කට පසුව වාහනය තෙවන පාර්ශවයකට පැවරීමටද අවසර ලැබේ.

4.4 වාහන බලපත්‍ර ලබාදීමට අදාල සීමාවන් පහත දැක්වේ.

| ප්‍රේෂණ වල වටිනාකම (ඇ.ඩො.) | වාහන වර්ගය | හිමිකම ලැබීමට අදාල ප්‍රේෂණය කරන කාලසීමාව හා වාහනයේ CIF වටිනාකම |
|---|---|---|
| 3,000 හෝ ඊට වැඩි | රෝද දෙකක් සහිත, විදුලි බලයෙන් ක්‍රියාත්මක වන වාහන (Motor Bicycle - HS Code - 8711) | 2022 මැයි 01 දින සිට 2023 අප්‍රේල් 30 දින හෝ ඊට පළමුව වාහන බලපත්‍රය ඉල්ලුම් කරන දින දක්වා ප්‍රේෂණය කරන ලද විදේශ විනිමය වටිනාකමෙන් 50% ට අඩු හෝ සමාන, උපරිම CIF අගය ඇ.ඩො.25,000 ට යටත්ව |
| 20,000 හෝ ඊට වැඩි | රෝද හතරක් සහිත, විදුලි බලයෙන් ක්‍රියාත්මක වන වාහන [ Motor Car - HS Code - 8703 Commercial Vehicle - HS Code - 8704 (Double Cab,Van,Tipper)] | 2022 මැයි 01 දින සිට 2022 දෙසැම්බර් 31 දින හෝ ඊට පළමුව වාහන බලපත්‍රය ඉල්ලුම් කරන දින දක්වා ප්‍රේෂණය කරන ලද විදේශ විනිමය වටිනාකමෙන් 50% ට අඩු හෝ සමාන, උපරිම CIF අගය ඇ.ඩො.65,000 ට යටත්ව |

4.5 මෙම යෝජනා ක්‍රමය යටතේ විද්‍යුත් වාහනයක් ආනයනය කිරීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ව්‍යාජ ලේඛන හෝ අසත්‍ය තොරතුරු ඉදිරිපත් කරන ඕනෑම පුද්ගලයෙකුට එරෙහිව ශ්‍රී ලංකාවේ පවත්නා නීතිය යටතේ නීතිමය ක්‍රියාමාර්ග ගනු ලබන අතර, එතැන් පටන් වසර 10 ක් ගතවන තුරු ඔහු/ඇය රජය/ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන්ට පිරිනමනු ලබන කිසිදු ප්‍රතිලාභයක් සඳහා නුසුදුස්සකු වනු ඇත.

## 5. සම්පූර්ණ කළ යුතු නිර්ණායක

5.1 විද්‍යුත් වාහනයේ "බැටරි ඇසුරුම සහ විදුලි මෝටරය සඳහා අවම වශයෙන් වසර 3 ක් සඳහා වත් නිෂ්පාදකයින්ගේ වගකීමක්" තිබිය යුතු අතර ජාත්‍යන්තර විදුලි වාහන (EV) මාර්ග ආරක්ෂණ ප්‍රමිතීන් ද සපුරාලිය යුතුය. අනුමත/සම්මත ක්‍රියාපටිපාටි/ක්‍රමවේදවලට අනුකූලව, භාවිතා කළ බැටරිය බැහැර කිරීමේ වගකීම භාර ගන්නා බලයලත් නියෝජිතයකු විසින් සහතිකයක් ලබා දිය යුතුය.

5.2 අධි වෝල්ටීයතා (HW) බැටරි සහ විද්‍යුත් වාහනයේ බල කළමනාකරණ පද්ධති මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූල විය යුතුය.

5.3 පාවිච්චි නොකල විද්‍යුත් වාහනයක් (Brand New) හෝ ධාවන මනුව ශූන්‍ය (New) වියයුතු අතර විද්‍යුත් වාහනය හා ඊට අදාළ බැටරිය නිෂ්පාදිත වර්ෂයේ සිට මාස 06 ක කාලයක් ඇතුලත ශ්‍රී ලංකාවට ආනයනය කල යුතුය .

5.4 රෝද හතරේ වාහන සම්බන්ධයෙන් වන විට එය, එක් බල ආරෝපණයකින්, "අවම ධාවන පරාසය 200 km ට වඩා වැඩිවිය යුතුය".

5.5 ණයවර ලිපිය නිකුත් කිරීම සඳහා අවශ්‍ය අරමුදල් ප්‍රතිලාභියාගේම බැංකු ගිණුමෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා අදාළ සමාගමට මාරු කළ යුතුය. (වාහන ආනයනය කිරීමේ සම්පූර්ණ පිරිවැය ප්‍රතිලාභියා විසින් ප්‍රේෂණය කර ඇති මුදලින් දරන බව සහතික කිරීමට සාක්ෂි තිබිය යුතුය.) වාහනයේ පිරිවැය ප්‍රතිලාභියා විසින් අදාළ පාර්ශව වෙත ගෙවිය යුත්තේ විදේශ මුදලින් පමණි. අදාල රජයේ බදු මුදල, ප්‍රතිලාභියා විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවකට එවන ලද විදේශ විනිමය පරිවර්තනය කර රුපියල් වලින් ගෙවිය යුතුය.

## 6. මෙහෙයුම් ක්‍රමවේදය

6.1 මෙම යෝජනා ක්‍රමය යටතේ විදුලි වාහනයක් ආනයනය කිරීම සඳහා වන අයදුම්පත කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ (www.labourmin.gov.lk) හෝ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ (www.slbfe.lk) වෙබ් අඩවි තුලින් බාගත කර ගත හැකි ය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය අදාළ සියළුම ලිපි ලේඛන සහිතව කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයට භාර දිය යුතුය.

6.2 එතෙර රැකියා වල නියුක්ත සුදුසුකම්ලත් ශ්‍රී ලාංකිකයින් විසින් මෙරටට ප්‍රේෂණය කරන ලද විදේශ මුදල් ප්‍රමාණය සහ රුපියල්වලට පරිවර්තනය කරන ලද මුදල සහ තම විදේශ විනිමය ඉතුරුම් ප්‍රමාණය ඇතුළුව මුළු වාර්ෂික ප්‍රේෂණ ප්‍රමාණය සඳහන් කරමින් තහවුරු කිරීමේ ලිපියක් අදාල බැංකුව විසින් ලබා දිය යුතුය. (මේ සඳහා ආකෘති පත්‍රයක් හඳුන්වා දෙනු ලැබේ.)

6.3 එතෙර රැකියා වල නියුතු ශ්‍රී ලාංකිකයා විසින් නිසි පරිදී සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය හා අනෙකුත් ලියකියවිලි එම ශ්‍රී ලාංකිකයා හෝ ඔහු /ඇය විසින් ලිඛිතව බලය පවරන ලද අයෙකු මගින් විදේශ රැකියා විෂය භාර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව එකී අමාත්‍යාංශය විසින් වාහන ආනයන බලපත්‍රය නිකුත් කරන අතර එසේ නිකුත් කරන ලද බලපත්‍රය නිකුත් කල දින සිට මාස හයක (06) කාලයක් සඳහා වලංගු වේ.

මෙම යෝජනා ක්‍රමය යටතේ වාහන ආනයන බලපත්‍රය සඳහා ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් කරනු ලබන ඕනෑම ලේඛනයක නිරවද්‍යතාවය අදාළ බලධාරීන් වෙතින් තහවුරු කර ගැනීමේ බලය කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය සතු වේ.

7.අර්ථ නිරූපණ

මෙම චක්‍රලේඛයෙහි "එතෙර රැකියාවක නියුතු ශ්‍රී ලාංකිකයකු" යනුවෙන් අදහස් කරනුයේ ඕනෑම විදේශ රටක රැකියාවක යෙදෙන ශ්‍රී ලාංකිකයෙකු වේ. ඒ බව සනාථ කිරීම සඳහා රැකියා කොන්ත්‍රාත්තුවේ / ගිවිසුමේ පිටපතක් හෝ සේවා යෝජකයා විසින් සේවා නියුක්තිය තහවුරු කර නිකුත් කර ඇති ලිපියක් හෝ වෙනත් අදාල ලේඛණයක් ඉදිරිපත් කළ යුතුය.

8. චක්‍රලේඛයේ අඩංගු කරුණු සම්බන්ධයෙන් කිසියම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක **+94 112 582 447** ඔස්සේ මෙම අමාත්‍යංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) අමතා ලබා ගත හැකිය.

මෙම චක්‍රලේඛය මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යංශයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ එකඟතාවය මත නිකුත් කර ඇත.

ආර්.පි .ඒ. විමලවීර
ලේකම්
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යංශය